**දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - 2018**

**-------------------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

---------------

**1.1 මතය**

**-------**

**දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ** 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

--------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.989,505 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.165,974 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.823,531 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අරමුදලට ප්‍රාග්ධන ප්‍රදානය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ට සහ විශ්ව විද්‍යාල සිසුන්ට ශිෂ්‍යාධාර ගෙවීමේදී සෑම වර්ෂයකම ප්‍රමාදයන් පැවති අතර එය වළක්වා ගැනීමට නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී දෘශ්‍යාබාධිත සිසුන් 88 දෙනෙකුට ප්‍රමාදවී ශිෂ්‍යාධාර ලබාදී තිබුණි. | ප්‍රතිලාභියාට ගෙවන මුදල මාස තුනකට වරක් ගෙවන බැවින් වර්ෂයේ අවසාන කාර්තුවේ ගෙවීම් ඊලඟ වර්ෂයේ මුල් කාර්තුවේදී ගෙවීම් කරනු ලබයි. කෙසේ නමුත් ඉදිරි වර්ෂවලදී අවසාන කාර්තුවේ වවුචර් මාසිකව ලබාගෙන වර්ෂය තුළම ගෙවීම් ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරන බව දක්වා තිබුණි. | දෘශ්‍යාබාධිත සිසුන්ට ශිෂ්‍යාධාර අදාල අවස්ථාවේදීම ලබාදීම මගින් සිසුන්ගේ අවශ්‍යතාවය ඉටුකර ගැනීමට හැකිවන බැවින් එය ප්‍රමාද නොකළ යුතුය. |
| (ආ) | අක්ෂි ආබාධ සහිත පුද්ගලයන් 15 දෙනෙකුට අක්ෂිකාච ලබාදීම සඳහා වූ රු.200,000 ක ප්‍රතිපාදනයෙන් රු.36,600 ක් වැයකර පුද්ගලයන් 03 දෙනෙකුට පමණක් අක්ෂිකාච ලබාදී තිබුණි. අක්ෂිකාච ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබීමේ හේතුවෙන් ප්‍රතිපාදිත මුදල් උපරිමව උපයෝජනය කිරීමට නොහැකිවී තිබුණි. | අක්ෂි ආබාධ සහිත පුද්ගලයින්ට අක්ෂි කාච ලබාදීමේ වැඩසටහනේදී දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ ආධාර ලබාදෙනුයේ වයස අවුරුදු 60 ට අඩු පුද්ගලයින් සඳහා පමණි.එසේම නොමිලේ අක්ෂි කාච ලබාදීමේ ව්‍යාපෘති සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන මගින්ද සිදුකරයි. මෙම හේතූන් නිසා දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල වෙත ලැබෙන ඉල්ලීම් විශාල ලෙස අඩුවී ඇත. කෙසේ වුවද අක්ෂි කාච සඳහා අරමුදල වෙත කරනු ලබන ඉල්ලීම් ප්‍රමාණය අනුව තව දුරටත් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කරනු ලබන මුදල පාලනය කොට සීමිත අවශ්‍යතා ඉටු කිරීමට අපේක්ෂා කරන බව දක්වා තිබුණි. | දෘශ්‍යාබාධිතයන් පිළිබඳ තොරතුරු ලබාගෙන අවශ්‍යතාවය පරිදි අක්ෂිකාච ලබාදීමට ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | පුනරුත්ථාපන වැඩ සටහන යටතේ ආයතන 02 ක දෘශ්‍යාබාධිත සිසුන් 50 දෙනෙකුගේ පුහුණුවීම් කටයුතු වෙනුවෙන් රු.1,000,000 ක් වෙන්කර තිබුණද රු.863,400 ක් වැයකර සිසුන් 16 දෙනෙකු පමණක් පුහුණු කර තිබුණි. | ශ්‍රී ලංකා අන්ධජන සේවා මණ්ඩලය විසින් පවත්වාගෙන යන පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ මෙම වසරේ පසුවිපරම් කිරීමක් සිදුකර කළමනාකරණ කමිටුව සඳහා ඉදිරිපත් කර ඇත. අනෙකුත් සංවිධානවල ප්‍රගතියද ඉදිරියේදී පරීක්ෂා කිරීමට නියමිත බව දක්වා තිබුණි. | දෘශ්‍යාබාධිත සිසුන්ගේ පුහුණුවීම් කටයුතු පිළිබඳ පසුවිපරම් කිරීම සිදුකර සිසුන් ප්‍රමාණය වැඩිකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ දෘශ්‍යාබාධිත කාන්තාවන් සඳහා මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන පේෂකර්ම පාඨමාලාව පසුගිය වර්ෂ 04 ක සිට අලාභ තත්ත්වයෙන් පැවති අතර 2019 වර්ෂයේදී එහි කටයුතු නතරකර තිබුණි. පාඨමාලාව සඳහා පුහුණුලාභීන් ඇතුළත් කර ගැනීමට නිසි සැළැස්මක් සකස්කර ගෙන නොතිබුණු අතර වර්ෂ කිහිපයක සිට දෘශ්‍යාබාධිත කාන්තාවන් 03 දෙනෙකු පමණක් පුහුණුලාභීන් ලෙස යොදවා ගෙන තිබුණි. තවද පේෂකර්ම අලෙවිය වර්ධනය වී නොතිබුණි. දැනට පවත්නා තත්ත්වය සම්බන්ධව වාර්තාවක් පාලක සභාවට ඉදිරිපත් කරන ලෙස වෘත්තීය පුහුණු ආයතනයේ ස්ථානභාර නිලධාරියා දැනුවත් කර තිබුණද 2019 ජුනි 30 දින තෙක් එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම දෘශ්‍යාබාධිත කාන්තාවන්ගේ නිෂ්පාදන වේගයද ඉතා අඩු අතර ඔවුන් දිගුකාලීනව රැදී නොසිටියි. එය නිෂ්පාදන ප්‍රමාණය අඩුවීමට හා ලාභ ලැබීමට බලපායි. සීදූව දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානය සඳහා සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවිණි මිලදී ගත් අමුද්‍රව්‍ය තිබීම ඊට හේතුවී තිබුණි. පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් නව යන්ත්‍ර කීපයක් සහ පුහුණු උපදේශක වරයෙකුගේ සේවය ලබාදීමට එකඟ වී ඇති අතර ඒ සඳහා වන ව්‍යාපෘති වාර්තා පිළියෙල කර ඇත.එම වාර්තා ඉදිරි කළමනාකරණ රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන අදාල නිෂ්පාදන කටයුතු නැවතත් ඇරඹීමට අපේක්ෂිත බව දක්වා තිබුණි. | මෙම පේෂකර්ම මධ්‍යස්ථානයට උපදේශිකාවක් පත්කර පාඨමාලාව ආරම්භ කිරීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඉ) | දෘශ්‍යාබාධිතයන්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් සැපයීම සහ දෘශ්‍යාබාධිතයින් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම පනතේ සඳහන් පරමාර්ථ 02 ක් ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපාදනද වෙන්කර ගෙන නොතිබුණි. | දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල වෙත ලැබෙන ප්‍රතිපාදන සීමිත වීම නිසා දෘශ්‍යාබාධිතයින් සඳහා ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස නිවාස පහසුකම් සැපයීම සීමා වී ඇති අතර දෘශ්‍යාබාධිතයින් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සීදූව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පවත්වාගෙන යනු ලබන දිරිය පොල මගින් අළෙවි කිරීමට කටයුතු යොදා ඇත. ඉදිරියේදී අවස්ථානුකූලව දෘශ්‍යාබාධිත නිෂ්පාදන අලෙවි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව දක්වා තිබුණි. | මෙම පරමාර්ථ 02 ක දෘශ්‍යාබාධිතයින් සඳහා ඉතා වැදගත්වන බැවින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල සඳහා වූ ක්‍රියාකාරී සැළැස්ම නැවත සංශෝධනය කර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට සංශෝධිත ක්‍රියාකාරී සැළැස්මක් සකස්කර තිබුණද සැළැස්මේ ඉලක්ක සපුරා ගැනීමට හැකිවී නොතිබුණි. | දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනතේ අරමුණු ප්‍රකාරව අරමුදල සඳහාවූ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන ශීර්ෂයන්ගේ ඉලක්ක සපුරාගෙන ඇත. උදාහරණ ලෙස අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ,ක්‍රීඩා ආධාර, පුනරුත්ථාපන ආධාර, වෘත්තීය පුහුණුව ආදිය දැක්විය හැකි බව දක්වා තිබුණි. | දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ක්‍රියාකාරී සැළැස්ම ඊට අනුකූලවන පරිදි සකස්කර ගත යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය ලේඛනයේ වියදම් සහ තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 10 සිට සියයට 81 ක දක්වාවූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය. | දෘශ්‍යාබාධිතයන්ට අක්ෂිකාච ලබාදීම සඳහා වාර්ෂික අයවැයෙන් රු.200,000.00 වෙන්කරනු ලැබුවද ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලට කරනු ලබන ඉල්ලීම් අඩුවී තිබීම අයවැය ලේඛනය හා තත්‍ය වියදම් අතර පරතරයට වඩාත් හේතුවී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කරනු ලබන ප්‍රතිපාදන පාලනය තුළින් ඉදිරියේදී අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදාගැනීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | අයවැය ලේඛණය වියදම් සහ තත්‍ය වියදම් අතර විචලනයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |